# කර්මාන්ත

## සමස්ත උපනතීන්

කාර්මික නිෂ්පාදන, අපනයන සහ එකතු වූ අගයයන්හි ඇති වූ ඉහළයාම් වලින් පිළිබිඹු වූ පරිදි 1993 වර්ෂයේදී කර්මාන්ත අංශයේ සැළකියයුතු වර්ධනයක් ඇතිවිය. මෙය පවත්නා කර්මාන්තයන්හි නිෂ්පාදනය ඉහළයාමේ සහ නිෂ්පාදන කර්මාන්ත ගණනාවක නව ධාරිතාවයන් බිහිවීමේ ප්‍රතිඵලයකි. 1992 වර්ෂයේදී මූර්ත වශයෙන් සියයට 12 කින් වර්ධනය වූ කාර්මික නිමැවුමේ වටිනාකම 1993 දී සියයට 14 කින් ප්‍රසාරණය විය. මෙම වර්ධනයට මූලික වශයෙන්ම හේතු වූයේ සියයට 13 කින් වර්ධනය වූ පෞද්ගලික අංශයේ කර්මාන්තයන් ය. මුළු කාර්මික නිෂ්පාදනයෙන් අටෙන් එකකට පමණක් දායක වන්නා වූ රාජ්‍ය අංශයේ කර්මාන්තයන්ද සියයට 20 ක වර්ධනයක් වාර්තා කරන ලදී. මෙම සිත්ගන්නා සුළු නිෂ්පාදන ප්‍රසාරණයත් සමගම කාර්මික අංශය ආර්ථිකයේ ප්‍රධාන වර්ධන අංශය බවට පත්වී ඇත. එසේම මෙම නිෂ්පාදනයේ වර්ධන ක්‍රියාකාරිත්වය දේශීය වෙළෙඳපොළ මුල් කරගත් කර්මාන්තයන් මෙන්ම අපනයන මුල් කරගත් කර්මාන්තයන් වෙතින්ද පිළිබිඹු විය.

පෞද්ගලික අංශය තුළ විශාල වර්ධනයක් වාර්තා කළ කාර්මික උප අංශයන් වූයේ: රෙදිපිළි, ඇඳුම් පැළඳුම් සහ සම් නිෂ්පාදිත; රසායනික, රබර් සහ ප්ලාස්ටික් නිෂ්පාදිත; ලෝහ නොවන ඛනිජ නිෂ්පාදිත; ආහාර පාන වර්ග සහ දුම්කොළ; දැව හා දැව නිෂ්පාදිත සහ කඩදාසි හා කඩදාසි නිෂ්පාදන යන නිෂ්පාදනයන්ය. රාජ්‍ය අංශයේ කර්මාන්තයන්හි නිෂ්පාදනය වැඩිවීමට මූලික වූයේ ඛනිජ තෙල් පිරිපහදුවේ නිමැවුමේ තියුණු වැඩිවීමය.

1993 දී අපනයන මුල් කරගත් කර්මාන්තයන් සමස්තයක් ලෙස ගත්විට වි.ගැ.හි. වටිනාකම අනුව සියයට 21 ක සැළකියයුතු වර්ධනයක් වාර්තා කරන ලදී. 1992 දී රුපියල් දශලක්ෂ 76,699 සිට 1993 දී රුපියල් දශලක්ෂ 100,420 දක්වා කාර්මික අපනයන වටිනාකම වැඩිවිය.

## නිෂ්පාදනය

1993 වර්ෂයේදී කාර්මික නිමැවුම් වටිනාකම මූර්ත වශයෙන් සියයට 14 කින් වැඩිවී ඇතැයි ඇස්තමේන්තු කර ඇත. ඛනිජ තෙල් නිමැවුම් වටිනාකම බැහැර කළවිට කාර්මික නිෂ්පාදනයේ ඇස්තමේන්තු කළ වැඩිවීම සියයට 12 ක් විය.

1993 දී නිෂ්පාදනයේ වැඩිවීම් වාර්තා කළ කාර්මික උප අංශයන් වූයේ රසායනික, ඛනිජ තෙල් සහ ප්ලාස්ටික් නිෂ්පාදිත (සියයට 25); කඩදාසි සහ කඩදාසි නිෂ්පාදිත (සියයට 18), රෙදිපිළි, ඇඳුම්පැළඳුම් සහ සම් නිෂ්පාදිත (සියයට 17), දැව සහ දැව නිෂ්පාදිත (සියයට 18), ආහාර, පාන වර්ග සහ දුම්කොළ (සියයට 7), සහ අන් තැනක සඳහන් නොවූ නිෂ්පාදිත (සියයට 20) යන අංශයන්ය. මූලික ලෝහ නිෂ්පාදිත (සියයට 9) සහ සකස් කළ ලෝහ නිෂ්පාදිත (සියයට 2) යන උප අංශවල නිමැවුමේ පහත වැටීමක් වාර්තා විය.

1992 දී මූර්ත වශයෙන් සියයට 20 කින් වර්ධනය වූ පෞද්ගලික අංශයේ කර්මාන්තවල සමස්ත නිෂ්පාදනය 1993 දී තවදුරටත් සියයට 13 කින් වර්ධනය විය. රෙදිපිළි, ඇඳුම්පැළඳුම් සහ සම් නිෂ්පාදන, ආහාර, පානවර්ග සහ දුම්කොළ සහ රසායනික ද්‍රව්‍ය, රබර් සහ ප්ලාස්ටික් නිෂ්පාදිත යන කාර්මික නිෂ්පාදිත ගණයයන් තුනෙන් මෙම වර්ධනය විශාල වශයෙන් ජනිත විය.

පෙහෙකම්හල් තුනක් සහ සම් භාණ්ඩ නිෂ්පාදන ඒකකයක් පෞද්ගලිකරණය කිරීමත් සමග රෙදිපිළි, ඇඳුම්පැළඳුම් සහ සම් භාණ්ඩ උප අංශයේ නිෂ්පාදිතයට මුළුමනින්ම වාගේ දායක වූයේ පෞද්ගලික අංශයේ කර්මාන්තයන්ය. ඉහළ නගිමින් පැවැතුන ආරක්ෂණවාදී ප්‍රතිපත්තීන් සහ දැඩි තරඟකාරී තත්ත්වයන් සමඟ බටහිර රටවල පැවැති අහිතකර වෙළෙඳපොළ තත්ත්වයන් යටතේ පවා රෙදිපිළි සහ ඇඳුම් පැළඳුම් නිමැවුම 1993 දී සියයට 17 කින්

වර්ධනය විය. පසුගිය වර්ෂයේ මෙම අංශයේ වර්ධනය සියයට 31 ක් විය. රෙදිපිළි, ඇඳුම්පැළඳුම් සහ සම් නිෂ්පාදන අංශයේ සිදුවූ අඛන්ඩ වර්ධනය යුරෝපීය සහ උතුරු ඇමෙරිකානු වෙළඳ පොළවල් සඳහා යොමු වූ අපනයන මුල් කරගත් ඇඟළුම් කර්මාන්ත වල ප්‍රතිඵලයක් විය.

දේශීය වෙළෙඳපළ සඳහා නිෂ්පාදනය කරනු ලබන කමිස, කලිසම්, යට ඇඳුම් සහ ළමා ඇඳුම් වැනි නිෂ්පාදිතයන්හි නියැළුණු සුළු පරිමාණ ඇඟළුම් කර්මාන්තයන්ද මෙම සමස්ත වර්ධනයට දායක විය.

1993 වර්ෂය තුළ පංගු වලට යටත් නොවන ඇඟළුම් අපනයනවල අඛණ්ඩ වර්ධනයක් සිදුවිය. මෙහිලා යුරෝපීය ආර්ථික හවුල (යු.ආ.හ.) වෙත කරන ලද අපනයන විශේෂ විය. මෙම වර්ධනයට ප්‍රධාන වශයෙන්ම හේතු වූයේ ඇඟළුම් කම්හල් 200 ව්‍යාපෘතිය යටතේ 1993 වර්ෂය තුළදී ක්‍රියාත්මක වූ ඇඟළුම් කම්හල් 134 යි. රටට ලැබුන ඇඟළුම් පංගු ප්‍රමාණයේ සීමිත බව හේතුකොට, පංගුවලට යටත් නොවන ඇඟළුම් අපනයන වැඩිකිරීමට මෙම ව්‍යාපෘතිය දිරිමත් කෙරිණි.

තරඟකාරිත්වයට හා අයහපත් විදේශීය වෙළෙඳපොළවලට මුහුණ පැවද, ඇඟළුම් කර්මාන්තය රටේ විශාලතම විදේශ විනිමය උපයන කර්මාන්තය වශයෙන් තවදුරටත් රැඳීමට සමත් විය. 1993 දී ඇඟළුම් කර්මාන්තය රුපියල් දශලක්ෂ 66,785 ක අපනයන ඉපැයීම් වාර්තා කරන ලදී.

1993 දී ඇඟළුම් කර්මාන්තශාලා 200 ව්‍යාපෘතිය යටතේ කර්මාන්තශාලා 134 ක නිෂ්පාදනය ආරම්භ කිරීමත් සමග ඇඟළුම් කර්මාන්තයේ නිමැවුම්ගත ධාරිතාවයේ සැළකියයුතු වැඩිවීමක් සිදුවිය. කෙසේ වෙතත්, ඇඟළුම් නිෂ්පාදන සැපයුමේ සිදුවූ ක්ෂණික වර්ධනය එම නිෂ්පාදනවල මිල ගණන් පහළ දැමීමට කෙටිකාලීනව හේතුවිය. මෑත කාලයේදී කර්මාන්තයේ ප්‍රමිතීන්වල වර්ධනයක් සිදුවී ඇතත්, නිෂ්පාදන තත්ත්වය තවදුරටත් උසස් කිරීම, නිෂ්පාදන ක්‍රියාවලිය සංකීර්ණ කිරීම මෙන්ම නිෂ්පාදන කටයුතුවල විවිධාංගීකරණය සහ වර්ධනය සඳහා වඩා යෝග්‍ය අලෙවි උපක්‍රම අනුගමනය කිරීම අවශ්‍ය වේ. මෙය විශේෂයෙන්ම වැදගත් වන්නේ මෙම කලාපය තුළම නැගී එන සෙසු අඩු පිරිවැයකින් යුතු නිෂ්පාදනයන්ගෙන් මතුවන වැඩිවන තරඟකාරීත්වය නිසයි.

නූල් කැටීම, වියීම සහ මුද්‍රණය යන අංශ තුනෙන් සමන්විත පේෂ කර්මාන්තයේ මුළු නිමැවුම 1993 දී සැළකියයුතු ලෙස වර්ධන විය. මෙයට විශාල වශයෙන් දායක වූයේ සියයට 39 ක නිමැවුම් වර්ධනයක් වාර්තා කළ ශ්‍රී ලංකා අංයෝජන මණ්ඩලයට යටත් අපනයන සඳහා නැඹුරු වූ ව්‍යවසායකයින්ය. වර්ෂය තුළදී නිෂ්පාදන තත්ත්වයේ සීඝ්‍ර දියුණුවක් පෙන්නුම් කළ දේශීය වෙළෙඳපොළට නැඹුරු වූ පේෂ කර්මාන්තයේ ද නිමැවුමේ ප්‍රසාරණයක් විය. ප්‍රධාන පාවහන් නිෂ්පාදන ආයතන තුනක සහ සුළු පරිමාණ කර්මාන්ත රැසක සිදුවූ නිෂ්පාදන වර්ධනය සම් භාණ්ඩ නිෂ්පාදන අංශයේ නිමැවුමේ වැඩිවීමට හේතු විය.

1992 වර්ෂයේ පැවැති දිගු නියඟය හේතුවෙන් දුර්වල ක්‍රියාකාරිත්වයක් පෙන්වූ ආහාර, පාන වර්ග සහ දුම්කොළ නිමැවුම 1993 දී සියයට 9 කින් වර්ධනය විය. මෙම කර්මාන්ත ගණයේ පෞද්ගලික අංශයේ කර්මාන්තවල සිදුවූ නිෂ්පාදන වර්ධනයට විශාල වශයෙන්ම හේතු වූයේ පිටි, ඇසුරුම් කළ තේ, කිරි නිෂ්පාදන, විස්කෝතු, සත්ව ආහාර, සීනි සහ මත්පැන් යනාදී කර්මාන්තයන් ය. යෙදවුම්වල ආයාත බදු අඩුවීමේ හේතුවෙන් නිෂ්පාදන පිරිවැය අඩු වුවත්, මාගරින් නිෂ්පාදනයේ ඉතා සුළු වර්ධනයක් පමණක් පෙන්නුම් කරන ලදී. නිර්යාත සඳහා නැඹුරු වූ දුම්කොළ සකස් කිරීම, මාළු, ඉස්සන් සහ එවැනි නිෂ්පාදිත කර්මාන්ත ද ආහාර, පාන වර්ග සහ දුම්කොළ අංශයේ නිෂ්පාදනයේ වර්ධනයට දායක විය. ආහාර, පාන වර්ග සහ දුම්කොළ ගණයේ මුළු නිෂ්පාදනයට විශාල බලපෑමක් කරනු ලබන දුම්කොළ නිෂ්පාදනය, සිගරැට් නිමැවුමේ වැඩිවීමේ හේතුවෙන් සියයට 6 ක වර්ධනයක් වාර්තා කරන ලදී.

1993 දී රසායනික, ඛනිජ තෙල්, රබර් සහ ප්ලාස්ටික් නිෂ්පාදන ගණයේ නිමැවුමෙන් අඩක් පමණ පෞද්ගලික අංශය මගින් සපයන ලදී. රබර් නිෂ්පාදිත, කෘෂි රසායන ද්‍රව්‍ය සහ පොහොර, සායම් සහ වාර්නිෂ් වැනි පෞද්ගලික අංශයේ කර්මාන්තවල ඉහළ වර්ධනයක් වාර්තා විය. නිමැවුමේ මෙම වැඩිවීමට ප්‍රධාන සාධකය වූයේ අපනයන සඳහා නැඹුරු වූ ශ්‍රී ලංකා ආයෝජන මණ්ඩලයට යටත් ශල්‍ය සහ කර්මාන්ත අත්වැසුම්, කාර්මික සහ කෘෂිකාර්මික අංශ සඳහා අවශ්‍ය ටයර් යනාදී නිෂ්පාදන කර්මාන්තවල නිමැවුම් වැඩිවීමයි. රසායනික ද්‍රව්‍ය, රබර් සහ ප්ලාස්ටික් නිෂ්පාදන ගණයේ ඉහළ ක්‍රියාකාරිත්වය සඳහා වර්ෂය තුළ දේශීය වෙළෙඳපළේ පැවැති ඉහළ ඉල්ලුමද හේතුවිය.

ලෝහ නොවන ඛනිජ නිෂ්පාදන උප අංශයේ මුළු නිමැවුමෙන් පහෙන් හතරකට පමණ දායක වන්නේ පෞද්ගලික අංශයේ කර්මාන්තයි. ඉදිකිරීම් කර්මාන්තයේ ඇති වූ දියුණු ක්‍රියාකාරිත්වය හේතුකොටගෙන මෙම කර්මාන්තවල අඛණ්ඩ ප්‍රසාරණයක් 1993 දී ඇතිවිය. පිහන්බඩු, සිමෙන්ති, පෙරසවි කොන්ක්‍රීට්, ඇස්බැස්ටෝස් සහ මැණික් සහ දියමන්ති කැපීම සහ ඔප දැමීම යන අංශයන්හි නියුක්ත පෞද්ගලික අංශයේ කර්මාන්ත ඉහළ නිමැවුම් මට්ටම් වාර්තා කරන ලදී. වීදුරු නිෂ්පාදනයේ නියුක්ත විශාලතම කර්මාන්ත ශාලාවක මාස 12 ක් තිස්සේ පැවැති කම්කරු ආරවුල් හේතුකොටගෙන එය වසා තිබීම නිසා වීදුරු සහ වීදුරු නිමැවුම නොකඩවා පහත වැටුනි. ශ්‍රී ලංකා ආයෝජන මණ්ඩලයට අයත් අපනයනයට නැඹුරු වූ කුඩා පිහන් ප්‍රතිමා, ඩොලමයිට් නිෂ්පාදන සහ සැරසීමට ගන්නා ඉටිපන්දම් නිෂ්පාදන කර්මාන්ත, ලෝහ නොවන ඛනිජ නිෂ්පාදන ගණයේ නිමැවුමේ සැළකියයුතු වැඩිවීමක් වාර්තා කරන ලදී. දියමන්ති සැකසීමේ නියුක්ත විදේශීය ව්‍යාපාරික ආයතනයක නිෂ්පාදනයේ ඇති වූ තියුණු පහත වැටීම හේතුකොටගෙන දියමන්ති කැපීම සහ ඔප දැමීමේ කර්මාන්තයේ දුර්වල ක්‍රියාකාරිත්වයක් පෙන්නුම් කරන ලදී.

කඩදාසි සහ කඩදාසි නිෂ්පාදන ගණයේ මුළු නිෂ්පාදනයෙන් තුනෙන් දෙකකට දායක වන පෞද්ගලික අංශයේ කර්මාන්තයන් ප්‍රධාන වශයෙන් නියුක්ත වී ඇත්තේ මුද්‍රණ ශිල්පයෙහි, කඩදාසි සහ කඩදාසි බෝඩ් සෑදීමෙහි සහ ලේබල සහ කාටූන් නිෂ්පාදනයෙහිය.

1993 දී කඩදාසි සහ කඩදාසි නිෂ්පාදන ගණයේ ඉහළ නිෂ්පාදනය විශාල වශයෙන් ඇති වූයේ මුද්‍රණ අංශයෙනි. මෙම ගණයේ නිෂ්පාදිතයේ සැළකිය යුතු වැඩිවීමට ලේබල සහ ඇසුරුම් පෙට්ටි නිෂ්පාදනයද දායක වී ඇත. මුද්‍රණ සහ සුරක්ෂිත මුද්‍රණ කටයුතුවල නියුතු ශ්‍රී ලංකා ආයෝජන මණ්ඩලයේ කර්මාන්ත ද වර්ෂය තුළදී ඉහළ නිෂ්පාදනයක් වාර්තා කරන ලදී.

ලී බඩු අංශයද ඇතුලත්ව දැව නිෂ්පාදනය 1993 වර්ෂයේදී සියයට 23 කින් ප්‍රසාරණය විය. විශේෂයෙන් ඉදිකිරීම් අංශය නිසා ඉහළ ගිය දේශීය ඉල්ලුමත්, අපනයනවල ප්‍රසාරණයත් නිෂ්පාදනයේ වැඩිවීමට හේතු විය. ශ්‍රී ලංකා ආයෝජන මණ්ඩලයට අයත් අපනයන මුල්කර ගත් ලී පදනම් කරගත් ඇසුරුම් පෙට්ටි, ක්‍රීඩා භාණ්ඩ සහ ලීයෙන් තැනූ සෙල්ලම් බඩු නිෂ්පාදන කර්මාන්තවල නිෂ්පාදනයේ සැළකියයුතු වර්ධනයක් වර්ෂය තුළදී පෙන්නුම් කරන ලදී.

මුළුමනින්ම පෞද්ගලික කර්මාන්තවලින් යුක්ත සකස් කළ ලෝහ නිෂ්පාදන ගණයේ දුර්වල ක්‍රියාකාරිත්වයක් 1993 වර්ෂයේදී වාර්තා කරන ලදී. වානේ බහාලුම්, වානේ ඇමුණුම් සහ වානේ අච්චු වැනි නිෂ්පාදනයන්හි නියුක්ත වූ අපනයන මුල්කර ගත් ශ්‍රී ලංකා ආයෝජන මණ්ඩලයේ නිෂ්පාදන ආයතන දෙකක නිෂ්පාදනය තියුණු ලෙස පහත වැටීම මෙම ගණයේ නිමැවුමේ අඩුවීමට මූලික වශයෙන් හේතු විය. කෙසේ වුවද, සකස් කළ ලෝහ, විදුලි උපකරණ, කේබල් සහ බල්බ් වැනි නිෂ්පාදනයන්හි නියුක්ත කර්මාන්තයන්හි නිමැවුමේ වර්ධනයට ප්‍රධාන වශයෙන් හේතු වූයේ ඉදිකිරීම් කර්මාන්තයේ ඇති වූ අඛණ්ඩ වර්ධනයයි.

අන් තැනක සඳහන් නොවූ නිෂ්පාදන කර්මාන්තයන්හි නිෂ්පාදනය 1993 දී ආන්තික වශයෙන් වැඩි විය. පුරවන ලද සෙල්ලම් බඩු, රුවල් ඔරු, බුරුසු, ධීවර ආම්පන්න සහ නයිලෝන් දැල් වැනි නිෂ්පාදනයන්හි නියුක්ත කර්මාන්තවල නිමැවුමේ වැඩිවීම් වාර්තා විය.

## රාජ්‍ය අංශයේ කර්මාන්ත නිමැවුම් දර්ශකය

1.19 සංඛ්‍යා සටහන
රාජ්‍ය අංශයේ ප්‍රධාන කර්මාන්ත නිමැවුම් දර්ශකය 1991 - 1993
(1977 = 100)

| කාර්මික ගණය | 1991 | 1992 | 1993(අ) |
|---|---|---|---|
| 1. ආහාර, පාන වර්ග සහ දුම්කොළ | 18.3 | 13.4 | 8.1 |
| 2. රෙදිපිළි, ඇඳුම් පැළඳුම් සහ සම් නිෂ්පාදිත | 66.6 | 27.5 | 10.3 |
| 2.1 රෙදිපිළි | 90.5 | 37.9 | 14.2 |
| 3. දැව හා දැව නිෂ්පාදිත | 12.3 | 20.5 | 25.4 |
| 4. කඩදාසි හා කඩදාසි නිෂ්පාදිත | 137.4 | 156.6 | 174.1 |
| 5. රසායනික නිෂ්පාදිත | 112.5 | 86.9 | 121.8 |
| 5.1 ඛනිජ තෙල් | 113.1 | 91.8 | 129.4 |
| 6. ලෝහ නොවන ඛනිජ නිෂ්පාදිත | 143.5 | 143.4 | 124.0 |
| 6.1 සිමෙන්ති | 171.4 | 179.8 | 152.5 |
| 7. මූලික ලෝහ නිෂ්පාදිත | 111.5 | 125.7 | 92.4 |
| 8. සකස් කළ ලෝහ නිෂ්පාදිත | 17.4 | - | - |
| සියළුම ගණයයන් | 91.9 | 73.3 | 87.9 |
| ඛනිජ තෙල් නිෂ්පාදිත හැර | 68.2 | 52.7 | 41.7 |

මූලය : ශ්‍රී ලංකා මහ බැංකුව

(අ) තාවකාලික

ලංකා ලුණු (සියයට 61), ශ්‍රී ලංකා සීනි (සියයට 31), ලංකා වානේ (සියයට 26), රාජ්‍ය පතල් හා ඛනිජ සංවර්ධන (සියයට 25), ශ්‍රී ලංකා සිමෙන්ති (සියයට 15), ලංකා පිහන් (සියයට 10) යන ව්‍යවසායයන් නිෂ්පාදනයේ පහත වැටීම් වාර්තා කර ඇත.

රජයේ ජනතාකරණ වැඩපිළිවෙල යටතේ 1993 වර්ෂය තුළදී මත්තේගම පෙහෙකම්හල, හිඟුරාන සීනි කම්හල සහ ගාල්ලේ සහ පුත්තලමේ සිමෙන්ති කම්හල් දෙකේ අයිතිය රාජ්‍ය අංශයේ සිට පෞද්ගලික අංශයට පවරන ලදී. වර්ෂය තුළ කලාපයේ පැවති අයහපත් කාලගුණික තත්ත්වයන් හේතුකොටගෙන පුත්තලම ලුණු ලේවායේ නිෂ්පාදනය පහත වැටීම, සීමාසහිත ලංකා ලුණු සමාගමේ නිමැවුම පහත වැටීමට ප්‍රධාන වශයෙන් හේතු විය. රාජ්‍ය පතල් හා ඛනිජ සංවර්ධන සංස්ථාවේ නිමැවුම පහත වැටීමට ප්‍රධාන වශයෙන්ම හේතු වූයේ සීමාසහිත ලංකා ෆොස්පේට් සමාගමේ පැවති නිමි භාණ්ඩ තොග එකතුවයි. අමුද්‍රව්‍ය සැපයීම ප්‍රමාණවත් නොවීමේ ප්‍රතිඵලයක් වශයෙන් ලංකා වානේ සංස්ථාවේ නිමැවුම පහත වැටුනි.

වර්ෂය තුළදී නිෂ්පාදන වැඩිවීම් වාර්තා කළ රාජ්‍ය කාර්මික ව්‍යවසායයන් වූයේ, ලංකා ඛනිජ වැලි (සියයට 85), ලංකා ඛනිජ තෙල් (සියයට 40), රාජ්‍ය දැව (සියයට 23), ජාතික කඩදාසි (සියයට 11) සහ රාජ්‍ය රබර් නිෂ්පාදන සමාගම (සියයට 8) යන සංස්ථාවන්ය.

මෙම වසරේ ලංකා ඛනිජ තෙල් සංස්ථාවේ නිමැවුම වැඩිවීමට ප්‍රධාන වශයෙන්ම හේතු වූයේ වර්ෂය මුළුල්ලේම තෙල් පිරිපහදුව බාධාවකින් තොරව ක්‍රියාත්මක වීමත් එහි නිමැවුමගත ධාරිතාවයේ ඇති වූ වර්ධනයත් ය. පසුගිය වසරේ තෙල් පිරිපහදුවේ බොරතෙල් පෙරුම් ඒකකය ප්‍රධාන නවීකරණයක් සඳහා සති 14 ක කාලයක් වසා තැබීය. වර්ෂය පුරාම පැවති ඉල්මනයිට් ගබඩා කිරීමේ පහසුකම් වැඩිවීමේ ප්‍රතිඵලයක් වශයෙන් ලංකා ඛනිජ වැලි සංස්ථාවේ නිෂ්පාදන මට්ටම ඉහළ යන ලදී. වසර මුළුල්ලේම ඉහළ මට්ටමක පැවති දැව කපා හෙළීමේ කටයුතු හේතුවෙන් රාජ්‍ය දැව සංස්ථාවේ නිෂ්පාදනය වැඩිවිය.

රාජ්‍ය ව්‍යවසායයන් ආංශික වර්ගීකරණය අනුව බැලීමේදී රසායනික නිෂ්පාදන අංශය සියයට 40 ක උපරිම වර්ධනයක් වාර්තා කළ අතර, හිමැවුමේ වර්ධනයක් වාර්තා කළ අනිකුත් අංශ වූයේ දැව හා දැව නිෂ්පාදිත (සියයට 24) සහ කඩදාසි හා කඩදාසි නිෂ්පාදිත (සියයට 11) යන ඒවාය. නිමැවුමේ පහත වැටීම් වාර්තා කළ අංශ වූයේ: රෙදිපිළි, ඇඳුම් පැළඳුම් සහ සම් නිෂ්පාදිත (සියයට 62); ආහාර, පාන වර්ග සහ දුම්කොළ (සියයට 40); මූලික ලෝහ නිෂ්පාදිත (සියයට 26) සහ ලෝහ නොවන ඛනිජ නිෂ්පාදිත (සියයට 14) යන ඒවාය.

## එකතු වූ අගය

පවත්නා මිළ ගණන් අනුව, පසුගිය වර්ෂයේ සියයට 24 වර්ධනය හා සැසඳීමේදී, 1993 දී කර්මාන්තයන්හි එකතු වූ අගය සියයට 21 කින් වැඩි විය. කර්මාන්තශාලාවෙන් පිටවන විට නිමවුමේ වටිනාකමෙන් අමුද්‍රව්‍ය, බලය සහ ඉන්ධන වියදම් අඩු කිරීමෙන් එකතු වූ අගය ලබාගනු ලැබේ.

1.20 සංඛ්‍යා සටහන
කර්මාන්ත අංශයේ එකතු වූ අගය 1989 - 1993

(රුපියල් දශලක්ෂ)

| කාර්මික ගණය | 1989 | 1990 | 1991 | 1992(ආ) | 1993(අ) |
|---|---|---|---|---|---|
| 1. ආහාර, පාන වර්ග සහ දුම්කොළ | 10,168 | 12,065 | 15,070 | 18,668 | 21,706 |
| 2. රෙදිපිළි, ඇඳුම් පැළඳුම් සහ සම් නිෂ්පාදිත | 5,746 | 7,167 | 8,542 | 14,630 | 18,994 |
| 3. දැව හා දැව නිෂ්පාදිත (ගෘහ භාණ්ඩ ඇතුළුව) | 496 | 485 | 571 | 677 | 831 |
| 4. කඩදාසි හා කඩදාසි නිෂ්පාදිත | 745 | 1,019 | 1,167 | 1,397 | 1,911 |
| 5. රසායනික ද්‍රව්‍ය, ඛනිජ තෙල්, ගල් අඟුරු, රබර් සහ ප්ලාස්ටික් නිෂ්පාදිත | 3,531 | 2,428 | 3,199 | 3,989 | 4,738 |
| 6. ලෝහ නොවන ඛනිජ නිෂ්පාදිත (ඛනිජ තෙල් සහ ගල් අඟුරු හැර) | 1,218 | 4,742 | 4,905 | 5,918 | 7,153 |
| 7. මූලික ලෝහ නිෂ්පාදිත | 77 | 194 | 248 | 263 | 278 |
| 8. සකස් කළ ලෝහ නිෂ්පාදිත, යන්ත්‍ර සූත්‍ර සහ ප්‍රවාහන උපකරණ | 1,969 | 2,746 | 3,247 | 3,629 | 3,609 |
| 9. අන් තැනක සඳහන් නොවූ නිෂ්පාදිත | 117 | 138 | 1,092 | 1,196 | 1,531 |
| එකතුව | 24,067 | 30,984 | 38,041 | 50,367 | 60,751 |

මූලය : ශ්‍රී ලංකා මහ බැංකුව

(අ) තාවකාලික
(ආ) සංශෝධිත

1993 දී නිෂ්පාදන කර්මාන්තවල මුළු එකතු වූ අගය රුපියල් දශලක්ෂ 60,751 ක් විය. නිෂ්පාදන වටිනාකමේ ප්‍රතිශතයක් වශයෙන් ගත් විට, සාමාන්‍ය එකතු වූ අගය පසුගිය වසරේ සියයට 37 ක් සමග සැසඳීමේදී, 1993 වර්ෂයේදී සියයට 36 ක් විය. එකතු වූ අගයේ අනුපාතය සියයට 50 කට වඩා වැඩි කාර්මික ගණයයන් වූයේ: දැව හා දැව නිෂ්පාදිත (සියයට 68); සකස් කළ ලෝහ නිෂ්පාදිත (සියයට 61); ලෝහ නොවන ඛනිජ නිෂ්පාදිත (සියයට 58); කඩදාසි හා කඩදාසි නිෂ්පාදිත (සියයට 56) සහ ආහාර, පාන වර්ග සහ දුම්කොළ (සියයට 55) යන කාර්මික ගණයයන්ය. එකතු වූ අගයේ අනුපාතය සියයට 50 ට වඩා අඩු වූ කාර්මිත ගණයයන් වූයේ: රෙදිපිළි, ඇඳුම් පැළඳුම් සහ සම් නිෂ්පාදිත (සියයට 27); මූලික ලෝහ නිෂ්පාදිත (සියයට 19) සහ ඛනිජ තෙල් සහ රසායනික නිෂ්පාදිත (සියයට 16) යන කාර්මික ගණයයන්ය.

### බලය සහ ඉන්ධන

ලංකා විදුලිබල මණ්ඩලයට කරන ලද විකුණුම් අත්හළ විට 1993 වසරේදී කර්මාන්තවලට අලෙවි කරන ලද ඉන්ධනවල වටිනාකම සියයට 8 කින් වැඩි විය. උඳුන් තෙල් අලෙවිය සියයට 8 කින් ද බැර ඩීසල් අලෙවිය සියයට 10 කින් ද වැඩි විය.

**1.21 සංඛ්‍යා සටහන**
**කර්මාන්තයන්හි බලය හා ඉන්ධන භාවිතය 1992 - 1993**

| අයිතමය | 1992(ආ) | 1993(අ) |
|---|---|---|
| 1. විදුලි බල (ගිග වොට් පැය) (ඇ) | 1051.8 | 1183.0 |
| 1.1 කුඩා කර්මාන්ත | 76.0 | 78.4 |
| 1.2 මධ්‍යම කර්මාන්ත | 505.2 | 602.2 |
| 1.3 විශාල කර්මාන්ත | 470.6 | 502.4 |
| 2. කාර්මික ඉන්ධනවල දේශීය අලෙවිය (මෙ.ටො.දහස්) (ඈ) | 179.7 | 193.9 |
| 2.1 බැර ඩීසල් | 16.3 | 18.0 |
| 2.2 උඳුන් තෙල් | 163.4 | 175.9 |

මූලයන් : ලංකා විදුලිබල මණ්ඩලය,
ලංකා ඛනිජ තෙල් නීතිගත සංස්ථාව

(අ) තාවකාලික
(ආ) සංශෝධිත
(ඇ) කාර්මික නිෂ්පාදන හා අපනයන සැකසුම් කර්මාන්තයද ඇතුළත්ය. කිලෝ වොල්ට් ඇම්පියර් 50 ට අඩු ධාරිතාවයකින් යුත් කර්මාන්ත කුඩා කර්මාන්ත වශයෙන්ද, කිලෝ වොල්ට් ඇම්පියර් 50-500 අතර ගැනෙන ඒවා මධ්‍යම කර්මාන්ත වශයෙන්ද, කිලෝ වොල්ට් ඇම්පියර් 500 ට වැඩි ඒවා විශාල කර්මාන්ත වශයෙන්ද නිර්වචනය කෙරේ.
(ඈ) ලංකා විදුලිබල මණ්ඩලය හැර සෙසු ආයතනවලට කෙරුනු විකිණීම්

1993 වර්ෂයේදී කර්මාන්ත අංශයේ විදුලිබල භාවිතය සියයට 12 කින් වර්ධනය වී ඇත. මෙය කුඩා පරිමාණ කර්මාන්තයන්හි සියයට 3 ක, මධ්‍යම පරිමාණ කර්මාන්තයන්හි සියයට 19 ක සහ විශාල පරිමාණ කර්මාන්තයන්හි සියයට 7 ක වර්ධනයෙහි සංකලනයකි.

### කාර්මික ප්‍රතිපත්තිය

දේශීය කර්මාන්තයන්හි ජාත්‍යන්තර තරඟකාරීත්වය වර්ධනය කිරීම මුල්කොට ගත් කාර්මික ප්‍රතිපත්තිය වර්ෂය තුළදී අඛණ්ඩව ක්‍රියාත්මක විය. ඒ අනුව, පසුතල පහසුකම් වැඩිදියුණු කිරීම තුළින් කාර්මික ක්‍රියාවලියට අවශ්‍ය පහසුකම් සැපයීම මෙන්ම කර්මාන්ත අනුමත කිරීමේ පිළිවෙත සහ තීරුබදු ව්‍යුහය යථානුකරණය කිරීම ද සිදුවිය. දිරි දීමනා ව්‍යුහයේ විෂමතාවයන් අවම කිරීමේ අදහසින්, ශ්‍රී ලංකා ආයෝජන මණ්ඩලය (ශ්‍රී.ආ.ම.) මගින් ප්‍රදානය කරනු ලබන දිරි දීමනාවන් වල වෙනස්කම් රැසක් ඇති කරන ලදී. බදු විරාමයන් අහෝසි කිරීම, අපනයන අංශය සඳහා බදු ලිහිල් කිරීම සහ ආනයන බදු අඩු කිරීම එයට අයත් විය.

පළාත් මට්ටමෙන් නොයෙකුත් පසුතල පහසුකම් සැපයීමෙහිලා සහ කාර්මික ක්‍රියාවලියන්හි ඉහළ මට්ටමේ ප්‍රාදේශීය සම්බන්ධීකරණයක් ඇති කිරීම දිරිමත් කිරීමෙහිලා අවශ්‍ය ප්‍රතිපත්ති රාශියක් ක්‍රියාත්මක කරන ලදී. සබරගමුව, ඌව, දකුණ, මධ්‍යම, වයඹ සහ උතුරු මැද යන පළාත් වල පිහිටුවන ලද ප්‍රාදේශීය කාර්මික සේවා කමිටු හයේ කටයුතු 1993 වර්ෂයේදී ආරම්භ කරන ලදී. එසේම එම පළාත් හි පිහිටුවා ඇති කර්මාන්තයන් සඳහා අවශ්‍ය වන්නා වූ විවිධ සේවාවන් සැපයීම සඳහා ප්‍රාදේශීය කාර්මික සේවා මධ්‍යස්ථාන හතක් ද පිහිටුවන

ලදී. දිවයිනේ දීප ව්‍යාප්තව කාර්මික ජනපදයන් පිහිටුවීම තුළින් ප්‍රාදේශීයව පසුතල පහසුකම් දියුණු කිරීමේ රජයේ වැඩපිළිවෙල යටතේ ඒ සඳහා අවශ්‍ය ස්ථානයන් 34 ක් හඳුන්වා දෙන ලදී. වර්ෂය තුළ කාර්මික ජනපද හතක් ගම්පහ, මාතර, ගාල්ල, මොණරාගල සහ හලාවත යන ප්‍රදේශවල ආරම්භ කරන ලදී.

රට තුළ ඛනිජ සම්පත් පදනම් කරගත් කර්මාන්ත සංවර්ධනය හා වැඩි දියුණු කිරීමේ අරමුණින් 1992 ඛනිජ හා කැනීම් පනත යටතේ භූ විද්‍යාත්මක සමීක්ෂණ හා කැනීම් කාර්යාංශය පිහිටුවන ලදී. ක්‍රමානුකූල පදනමක් යටතේ භූ විද්‍යාත්මක සිතියම් ගත කිරීම, රටේ පිහිටුවා ඇති ඛනිජ සම්පත් හඳුනා ගැනීම සහ ඒවා ඇගයීම, ඛනිජ සැකසීම සහ අපනයනය කිරීම සම්බන්ධයෙන් කැනීම් කටයුතුවල ඇති වාණිජමය ශක්‍යතාවය ඇගයීම සහ ඛනිජ සම්පත් සෙවීම හා කැනීම් කටයුතු පාලනය කිරීම මෙම කාර්යාංශය සතු කටයුතු වේ.

පෞද්ගලීකරණය පිළිබඳ රජයේ ප්‍රතිපත්තිය අනුව, වර්ෂය තුළදී කැබිනට් මණ්ඩලය අනුමත කළ ටෙන්ඩර් මණ්ඩලය මගින් සීමාසහිත හිඟුරාණ සීනි සමාගමේ, සීමාසහිත මත්තේගම රෙදිපිළි සමාගමේ සහ සීමාසහිත පුත්තලම සිමෙන්ති සමාගමේ කොටස් වලින් සියයට 90 ක් සහ සීමාසහිත රුහුණු සිමෙන්ති සමාගමේ සහ සීමාසහිත ලංකා කැනරීස් සමාගමේ කොටස් වලින් සියයට 60 ක් බැගින් පිළිවෙලින් රුපියල් දශලක්ෂ 128, රුපියල් දශලක්ෂ 61, රුපියල් දශලක්ෂ 2,028, රුපියල් දශලක්ෂ 219 සහ රුපියල් දශලක්ෂ 102 ක වටිනාකමට අලෙවි කරන ලදී. මෙයට අමතරව, සීමාසහිත ලංකා පිහන් සමාගමේ සහ සීමාසහිත කැළණි ටයර් සමාගමේ කොටස් වලින් සියයට 37 ක් සහ සියයට 30 ක් මහජන කොටස් නිකුතුවක් මගින් පිළිවෙලින් රුපියල් දශලක්ෂ 443 ට සහ රුපියල් දශලක්ෂ 182 ට විකුණන ලදී.

## කර්මාන්තවලට පහසුකම්

විමර්ශනයට භාජනය වූ 1993 වර්ෂය තුළදී ද කර්මාන්ත අංශයට සහනදායී කොන්දේසි මත මූල්‍ය ආධාර නොකඩවා ලැබුණි. ජාතික සංවර්ධන බැංකුවේ සුළු හා මධ්‍ය පරිමාන කර්මාන්ත ණය යෝජනා ක්‍රමය (සු.ම.ක.) කර්මාන්ත වලට මූල්‍ය පහසුකම් සපයන ප්‍රධාන ප්‍රතිමූල්‍ය වැඩපිළිවෙල ලෙස ක්‍රියාත්මක විය. මෙයට අමතරව ලංකා සංවර්ධන මූල්‍ය සමායතනය (ලං.සං.මූ.සං.) ජාතික සංවර්ධන බැංකුව (ජා.සං.බැ.) සහ වාණිජ බැංකු කර්මාන්තකරුවන් සඳහා ණය සහ ප්‍රාග්ධන සහභාගීත්වය තුළින් සෘජු මූල්‍ය පහසුකම් සපයනු ලැබීය.

ශ්‍රී ලංකා මහ බැංකුව 1993 දෙසැම්බර් අවසානය වන විට රුපියල් දශලක්ෂ 4,309 ක ණය මුදල් ආවරණය වන පරිදි කුඩා පරිමාණයේ කර්මාන්ත සහ සුළු හා මධ්‍ය පරිමාණයේ කර්මාන්ත (සු.ම.ක.) I, II, III සහ IV වෙනුවෙන් සුරැකුම් 12,997 ක් නිකුත් කර තිබුණි. වසර අවසානය වන විට ණයකර 3,711 ක් සඳහා වූ රුපියල් දශලක්ෂ 979 සම්පූර්ණයෙන්ම අයකර ගෙන තිබුණි. නොපියවන ලද ණය සම්බන්ධව සලකන කල ප්‍රදානය කරන ලද ණයකර 7,850 ක් වෙනුවෙන් රුපියල් දශලක්ෂ 2,884 ක් හිඟව පැවතුණි. 1993 වසර අවසානයේ දී මහ බැංකුව විසින් හිමිකම් පෑම් 464 ක් පියවීම සඳහා රුපියල් දශලක්ෂ 66 ක මුදලක් ගෙවා තිබුණි.

1.22 සංඛ්‍යා සටහන

1993 දී ජාතික සංවර්ධන බැංකුව සහ සංවර්ධන මූල්‍ය සමායතනය

විසින් සැපයීමට අනුමැතිය දී ඇති ණය සහ මූල්‍ය පහසුකම්

| කාර්මික ගණය | ජා.ස.බැ. | | | | | | ස.මූ.ස. | | මුළු එකතුව | |
|---|---|---|---|---|---|---|---|---|---|---|
| | ප්‍රතිමූල්‍ය අනුමත කිරීම IV සු.ම.ක. යෝජනා ක්‍රමය | | ඍජු මූල්‍ය පහසුකම් | | එකතුව | | අනුමත කිරීම් | | | |
| | සංඛ්‍යාව | වටිනාකම රුපියල් දශ ලක්ෂ | සංඛ්‍යාව | වටිනාකම රුපියල් දශ ලක්ෂ | සංඛ්‍යාව | වටිනාකම රුපියල් දශ ලක්ෂ | සංඛ්‍යාව | වටිනාකම රුපියල් දශ ලක්ෂ | සංඛ්‍යාව | වටිනාකම රුපියල් දශ ලක්ෂ |
| 1. ආහාර, පාන වර්ග සහ දුම්කොළ | 528 | 243 | 27 | 603 | 555 | 846 | 75 | 329 | 630 | 1,175 |
| 2. රෙදිපිළි, ඇඳුම් පැළඳුම් සහ සම් නිෂ්පාදිත | 192 | 114 | 51 | 778 | 243 | 892 | 62 | 330 | 305 | 1,222 |
| 3. දැව හා දැව නිෂ්පාදිත | 157 | 61 | 3 | 5 | 160 | 66 | 29 | 44 | 189 | 110 |
| 4. කඩදාසි හා කඩදාසි නිෂ්පාදිත | 80 | 64 | 3 | 12 | 83 | 76 | 34 | 168 | 117 | 244 |
| 5. රසායනික ද්‍රව්‍ය, ඛනිජ තෙල්, ගල් අඟුරු, රබර් සහ ප්ලාස්ටික් නිෂ්පාදිත | 101 | 95 | 30 | 476 | 131 | 571 | 71 | 361 | 202 | 932 |
| 6. ලෝහ නොවන ඛනිජ නිෂ්පාදිත | 101 | 28 | - | - | 101 | 28 | 29 | 589 | 130 | 617 |
| 7. මූලික ලෝහ නිෂ්පාදිත | 204 | 67 | 32 | 645 | 236 | 712 | 03 | 2 | 239 | 714 |
| 8. සකස් කළ ලෝහ නිෂ්පාදිත, යන්ත්‍ර සූත්‍ර සහ ප්‍රවාහන උපකරණ | - | - | - | - | - | - | 44 | 378 | 44 | 378 |
| 9. අන් තැනක සඳහන් නොවූ නිෂ්පාදිත | 1,202 | 588 | 116 | 1,595 | 1,318 | 2,183 | - | - | 1,318 | 2,183 |
| එකතුව | 2,565 | 1,260 | 262 | 4,114 | 2,827 | 5,374 | 347 | 2,201 | 3,174 | 7,575 |

මූලයන් : ජාතික සංවර්ධන බැංකුව

ලංකා සංවර්ධන මූල්‍ය සමායතනය

ජාතික සංවර්ධන බැංකුව (ජා.සං.බැ.) ණය සහ ප්‍රාග්ධන සහභාගීත්වය තුළින් කාර්මික ව්‍යාපෘතීන් සඳහා සෘජු මූල්‍යාධාර සැපයීය. 1992 දී රුපියල් දශලක්ෂ 4,007 ක සෘජු මූල්‍යාධාර සපයමින් අනුමත කරන ලද ව්‍යාපෘති 312 හා සසඳන කල ජාතික සංවර්ධන බැංකුව විසින් 1993 දී රුපියල් දශලක්ෂ 4,114 ක සෘජු මූල්‍යාධාර ඇතුළත් ව්‍යාපෘති 262 ක් සඳහා අනුමැතිය දී ඇත. මෙම මූල්‍ය පහසුකම් වලින් ප්‍රධාන කොටසක් ලබාගත් ගණයයන් වූයේ: රෙදිපිළි, ඇඳුම් පැළඳුම් සහ සම් නිෂ්පාදිත; මූලික ලෝහ නිෂ්පාදිත; ආහාර, පාන වර්ග සහ දුම්කොළ; රසායනික නිෂ්පාදිත, රබර් සහ ප්ලාස්ටික් නිෂ්පාදන යන ඒවාය.

ලංකා සංවර්ධන මූල්‍ය සමායතනය කර්මාන්ත අංශය සඳහා ණය සහ ප්‍රාග්ධන සහභාගිත්වය වශයෙන් රුපියල් දශලක්ෂ 2,322 ක වටිනාකමක් සහිත ව්‍යාපෘති 347 සඳහා අනුමැතිය දෙන ලදී. මෙම මූල්‍ය පහසුකම් වලින් ප්‍රධාන කොටසක් ලබාගත් කාර්මික ගණයයන් වූයේ: ආහාර, පාන වර්ග සහ දුම්කොළ; රෙදිපිළි, ඇඳුම් පැළඳුම් හා සම් නිෂ්පාදිත; රබර් සහ ප්ලාස්ටික් නිෂ්පාදිත සහ සකස් කළ ලෝහ නිෂ්පාදිත යන ඒවාය.

වාණිජ බැංකු මගින් කර්මාන්ත අංශය සඳහා මූල්‍යමය පහසුකම් සැපයීම 1993 වසරේදී ද නොකඩවා සිදු විය. කෙසේ වුවද, 1993 සැප්තැම්බර් දක්වා මුල් මාස නමය අවසානයේදී කාර්මික කටයුතු සඳහා සැපයුණු වාණිජ බැංකු අත්තිකාරම් ප්‍රමාණය සියයට 8 ක අඩුවීමක් පෙන්නුම් කරමින් රුපියල් දශලක්ෂ 18,700 සිට 17,164 දක්වා පහත වැටුනි.

පෞද්ගලික ආයෝජනය

තවදුරටත් සිදු කරන ලද ආර්ථික ප්‍රතිසංස්කරණ සහ ලිහිල් කිරීම් වල ප්‍රතිඵලයක් වශයෙන් 1990 ට පසු කාලපරිච්ඡේදයේ පෞද්ගලික අංශය විසින් කර්මාන්ත ක්ෂේත්‍රය තුළ කරන ලද ආයෝජන විශාල ලෙස වැඩි විය. පසුගිය වසර හතරක කාලය තුළ හඳුන්වා දෙන ලද ප්‍රතිපත්තීන් අතර, දේශීය සහ විදේශීය ආයෝජනයන් සඳහා සපයන ලද දිරිගැන්වීම් / පහසුකම් වැඩිකිරීම, විනිමය පාලන කටයුතු තවදුරටත් ලිහිල් කිරීම, වෙළඳාම සහ ගෙවීම් සඳහා වූ බාධා ඉවත් කිරීම, කාර්මික ප්‍රතිපත්තිය යථානුකරණය කිරීම සහ දේශීය ව්‍යවසායකයන් සඳහා විදේශීය මුදල් බැංකු පහසුකම් වැඩිදියුණු කිරීම ද ඇතුළත් වේ.

1993 වසර අවසාන වනවිට කර්මාන්ත, විද්‍යා හා තාක්ෂණ අමාත්‍යාංශය මගින් 1990 ජනවාරි මස සිට ක්‍රියාත්මක කළ පුරෝගාමී කර්මාන්ත සහ දැනට පවතින කර්මාන්ත පුළුල් කිරීමේ වැඩපිළිවෙල යටතේ රුපියල් බිලියන 7 ක ආයෝජන ප්‍රමාණයක් කර්මාන්ත 405 ක් තුළ ආයෝජනය කර ඇත. නව හෝ උසස් තත්ත්වයේ භාණ්ඩ සහ ඉහළ මට්ටමේ තාක්ෂනය යොදාගන්නා කර්මාන්ත දියුණු කිරීමේ අරමුණෙන් මෙම වැඩපිළිවෙල ක්‍රියාත්මක කරන ලදී. එමෙන්ම රුපියල් බිලියන 36 ක නව ආයෝජන ප්‍රමාණයක් ශ්‍රී ලංකා ආයෝජන මණ්ඩලය යටතේ පවතින ව්‍යවසායයන් 280 ක් මගින් බිහිවිය. ඇඟළුම් කම්හල් 200 වැඩපිළිවෙල යටතේ ක්‍රියාත්මක වන කර්මාන්ත සඳහා ප්‍රාග්ධන වියදම් අවශ්‍යතාවය රුපියල් බිලියන 4.8 ක් ලෙස ඇස්තමේන්තු කොට ඇත.

පුරෝගාමී කර්මාන්ත සහ පවත්නා කර්මාන්ත පුළුල් කිරීම

කර්මාන්ත, විද්‍යා හා තාක්ෂණ අමාත්‍යාංශය අනුමත කළ කර්මාන්ත වල ආයෝජන කරන ලද ප්‍රමාණය රුපියල් බිලියන 7 කි. එම ආයෝජන ප්‍රමාණයෙන් සියයට 80 ක් පවතින කර්මාන්ත පුළුල් කිරීම සඳහා ආයෝජනය කොට ඇත. ඉතිරි ප්‍රමාණය පුරෝගාමී කර්මාන්ත වල ආයෝජනය වී ඇත. පුරෝගාමී කර්මාන්ත සඳහා වූ නව ආයෝජන වලින් විශාල ප්‍රමාණයක් රෙදිපිළි නොවන කර්මාන්ත සඳහා යොමු වී ඇත. රසායනික, රබර් සහ ප්ලාස්ටික් නිෂ්පාදන ගණය, පුරෝගාමී කර්මාන්ත වල කරන ලද මුළු ආයෝජනයෙන් සියයට 26 ක් එනම් රුපියල් දශලක්ෂ 346 ක් ලබා තිබුණි. මුළු ආයෝජනයෙන් භාගයක් පමණ ආහාර, පාන වර්ග සහ දුම්කොළ, ලෝහ නොවන ඛනිජ නිෂ්පාදන සහ අන් තැනක සඳහන් නොවූ නිෂ්පාදන භාණ්ඩ යන නිෂ්පාදන ගණයයන් ලබා තිබුණි. පවතින කර්මාන්ත පුළුල් කිරීම සඳහා කරන ලද නව ආයෝජනයන් අතුරින් රුපියල් දශලක්ෂ 4,348 ක් හෙවත්

මුළු ප්‍රමාණයෙන් සියයට 75 ක් ආහාර, පාන වර්ග සහ දුම්කොල; රෙදිපිළි, ඇඟළුම් සහ සම් භාණ්ඩ සහ රසායනික, රබර් සහ ප්ලාස්ටික් නිෂ්පාදන යන නිෂ්පාදන ගණයයන් තුනෙහි ආයෝජනය කර ඇත.

1.23 සංඛ්‍යා සටහන
පුරෝගාමී සහ කර්මාන්ත පුළුල් කිරීමේ යෝජනා ක්‍රමය යටතේ ඇති කර්මාන්ත වල දැනට කර ඇති ආයෝජනයන්

| කාර්මික ගණය | පුරෝගාමී කර්මාන්ත | | කර්මාන්ත පුළුල් කිරීම | | එකතුව | |
|---|---|---|---|---|---|---|
| | ව්‍යවසායයන් ගණන | ආයෝජන ප්‍රමාණය (රු.ද.ලක්ෂ) | ව්‍යවසායයන් ගණන | ආයෝජන ප්‍රමාණය (රු.ද.ලක්ෂ) | ව්‍යවසායයන් ගණන | ආයෝජන ප්‍රමාණය (රු.ද.ලක්ෂ) |
| 1 ආහාර, පාන වර්ග සහ දුම්කොළ | 8 | 107 | 34 | 1,989 | 42 | 2,096 |
| 2. රෙදිපිළි, ඇඳුම් පැළඳුම් සහ සම් නිෂ්පාදිත | 4 | 84 | 71 | 1,331 | 75 | 1,415 |
| 3. දැව හා දැව නිෂ්පාදිත | 1 | 1 | 4 | 30 | 5 | 31 |
| 4. කඩදාසි හා කඩදාසි නිෂ්පාදිත | 5 | 92 | 15 | 213 | 20 | 305 |
| 5. රසායනික ද්‍රව්‍ය, රබර් සහ ප්ලාස්ටික් නිෂ්පාදිත | 31 | 346 | 57 | 1,028 | 88 | 1,374 |
| 6. ලෝහ නොවන ඛනිජ නිෂ්පාදිත | 5 | 290 | 9 | 453 | 14 | 743 |
| 7. සකස් කළ ලෝහ නිෂ්පාදිත | 3 | 80 | 5 | 146 | 8 | 226 |
| 8. අන් තැනක සඳහන් නොවූ නිෂ්පාදිත | 34 | 258 | 47 | 451 | 81 | 709 |
| 9. සේවා (අලංකාරය සඳහා වවන ශාක ඇතුළුව) | 7 | 61 | 8 | 151 | 15 | 212 |
| එකතුව | 98 | 1,319 | 250 | 5,792 | 348 | 7,111 |

මූලය : කර්මාන්ත, විද්‍යා හා තාක්ෂණ අමාත්‍යාංශය

## ශ්‍රී ලංකා ආයෝජන මණ්ඩලය යටතේ ඇති ආයෝජන

'ඒකීය ආයෝජන ප්‍රවර්ධන මධ්‍යස්ථානය' ලෙස ශ්‍රී ලංකා ආයෝජන මණ්ඩලය (ශ්‍රී.ලං.ආ.ම.) නොකඩවා ක්‍රියාකරගෙන යන ලදී. 1993 වර්ෂය තුළදී මහ කොළඹ ආර්ථික කොමිසම පනතේ 17 වන වගන්තිය (විශේෂ දිරි ගැන්වීමේ යෝජනා ක්‍රමය) යටතේ ශ්‍රී.ලං.ආ.ම. ව්‍යාපෘතීන් 455 ක් අනුමත කළ අතර, වර්ෂය අවසානය වනවිට අනුමත කළ මුළු ව්‍යාපෘතීන් සංඛ්‍යාව, 1,179 දක්වා වැඩිවිය. මෙයින් ව්‍යවසායයන් 721 ක් විවිධ කර්මාන්ත ආරම්භ කිරීම සඳහා ශ්‍රී ලංකා ආයෝජන මණ්ඩලය සමඟ ගිවිසුම් ඇතිකර ගන්නා ලද ඒවා විය.

1993 වර්ෂය අවසානය වන විට, වාණිජමය නිෂ්පාදන කටයුතුවල නියැලී සිටි ව්‍යවසායයන්ගේ සංඛ්‍යාව 305 ක් විය. නිෂ්පාදන කටයුතු ආරම්භ කර තිබූ ව්‍යාපෘති අතරින් 84 ක් කටුනායක ආයෝජන ප්‍රවර්ධන කලාපය (ක.ආ.ප්‍ර.ක.) තුළද, 40 ක් බියගම ආයෝජන ප්‍රවර්ධන කලාපය (බි.ආ.ප්‍ර.ක.) තුළද, 10 ක් කොග්ගල ආයෝජන ප්‍රවර්ධන කලාපය (කො.ආ.ප්‍ර.ක.) තුළද, 171 ක් දිවයිනේ සෙසු ප්‍රදේශ වල ද පිහිටුවා තිබුණි.

1.24 සංඛ්‍යා සටහන

ශ්‍රී ලංකා ආයෝජන මණ්ඩලයේ ව්‍යවසායයන් විසින් දැනට කර ඇති ආයෝජනයන් (අ)

| කාර්මික ගණය | දැනට ක්‍රියාත්මක වෙමින් පවත්නා ව්‍යවසායයන් | දැනට කර ඇති විදේශ ආයෝජනයන් (රු.ද.ලක්‍ෂ) | දැනට කර ඇති දේශීය ආයෝජනයන් (රු.ද.ලක්‍ෂ) | මුළු ආයයෝජන (ආ) (රු.ද.ලක්‍ෂ) |
|---|---|---|---|---|
| 1 ආහාර, පාන වර්ග සහ දුම්කොළ | 16 | 197 | 133 | 330 |
| 2. රෙදිපිළි, ඇඳුම් පැළඳුම් සහ සම් නිෂ්පාදිත | 82 | 5,529 | 924 | 6,453 |
| 3. දැව හා දැව නිෂ්පාදිත | 03 | 109 | - | 109 |
| 4. කඩදාසි හා කඩදාසි නිෂ්පාදිත | 03 | 81 | 37 | 118 |
| 5. රසායනික ද්‍රව්‍ය, රබර් සහ ප්ලාස්ටික් නිෂ්පාදිත | 23 | 3,503 | 393 | 3,896 |
| 6. ලෝහ නොවන ඛනිජ නිෂ්පාදිත | 24 | 709 | 30 | 739 |
| 7. සකස් කළ ලෝහ නිෂ්පාදිත | 09 | 1,557 | 30 | 1,587 |
| 8. අන් තැනක සඳහන් නොවූ නිෂ්පාදිත | 64 | 2,687 | 273 | 2,960 |
| 9. සේවා (අලංකාරය සඳහා වවන ශාක ඇතුළුව) | 56 | 7,789 | 12,276 | 20,065 |
| එකතුව | 280 | 22,161 | 14,096 | 36,257 |

මූලය : ශ්‍රී ලංකා ආයෝජන මණ්ඩලය

(අ) ශ්‍රී ලංකා ආයෝජන මණ්ඩල පනතේ 17 වන වගන්තිය යටතේ අනුමත ව්‍යාපෘති

(ආ) 1993 දෙසැම්බර් 31 දක්වා

1993 වර්ෂය අවසානය වනවිට, ශ්‍රී ලංකා ආයෝජන මණ්ඩල පනතේ 17 වන වගන්තිය යටතේ (විශේෂ දිරිදීමනා යෝජනා ක්‍රමය) ක්‍රියාත්මක වෙමින් පැවැති යෝජනා ක්‍රමයන්හි සැළකිය යුතු නව ආයෝජනයන් ප්‍රමාණයක් කර්මාන්ත අංශයෙහි වාර්තා ගත විය. එම කාලය වන විට, නිෂ්පාදන කටයුතු වල නියැලී සිටි ව්‍යවසායයන් අතරින් රුපියල් දශලක්‍ෂ 36,266 ක ආයෝජනයක් සහිතව යෝජනා ක්‍රම 280 ක් ක්‍රියාත්මක වෙමින් පැවතුණි. මෙම ආයෝජනයන්හි විදේශීය ආයෝජන සංයුතිය සියයට 61 ක් විය. මුළු ආයෝජනයෙන් රෙදිපිළි, ඇඳුම් පැළඳුම් සහ සම් නිෂ්පාදිත; රසායනික ද්‍රව්‍ය, රබර් සහ ප්ලාස්ටික් සහ අන් තැනක සඳහන් නොවූ කාර්මික නිෂ්පාදිතයන් යන කාර්මික ගණයයන් පිළිවෙලින් සියයට 18, සියයට 11 සහ සියයට 8 ක් වශයෙන් හිමිකර ගන්නා ලදී.

1993 අවසානය වනවිට ශ්‍රී ලංකා ආයෝජන මණ්ඩලය යටතේ ඇති ව්‍යවසායයන්හි නියුතු මුළු සේවක සංඛ්‍යාව 122,165 ක් වූ අතර, 1993 වසරේ එහි වර්ධනය සියයට 17 ක් විය. මෙම සංඛ්‍යාවෙන් පුද්ගලයන් 69,952 ක් රෙදිපිළි, ඇඳුම් පැළඳුම් සහ සම් නිෂ්පාදන අංශයේ යෙදී සිටියහ. කෙසේ වුවද, මෙම අංශයේ ව්‍යවසායයන්ගේ සාපේක්‍ෂ සේවා නියුක්තිය, 1992 වසරේදී සියයට 63 සිට 1993 වසරේදී සියයට 57 දක්වා අඩු විය. රැකියා උත්පාදනයේ ඉහළ අනුපාතයන් වාර්තා කරන ලද්දේ දැව හා දැව නිෂ්පාදන; රසායනික ද්‍රව්‍ය, ඛනිජ තෙල්, රබර් සහ ප්ලාස්ටික් නිෂ්පාදන සහ ආහාර, පාන වර්ග සහ දුම්කොළ නිෂ්පාදන යන කාර්මික ගණයයන්හිය.

1993 දී ශ්‍රී ලංකා ආයෝජන මණ්ඩලය මගින් අනුමත කළ ව්‍යාපෘතීන්ගේ අපේක්‍ෂිත මුළු ආයෝජන ප්‍රමාණය රුපියල් දශලක්‍ෂ 43,669 ක් විය. එක්සත් රාජධානිය, ජපානය, දකුණු කොරියාව, ජර්මනිය, හොංකොං, ඕස්ට්‍රේලියාව, ස්වීඩනය, ඇමරිකා එක්සත් ජනපදය, පකිස්ථානය සහ බෙල්ජියම වැනි රට වලින් විදේශ ආයෝජකයෝ පැමිණියහ. 1993 වසරේදී ශ්‍රී. ලං.ආ.ම. විසින් අනුමත කරන ලද ව්‍යාපෘතීන් අතර පරිඝණක සියුම් උපකරණ, රබර් කිරි මිශ්‍රිත නිෂ්පාදිත, රබර් ලීයෙන් සැදූ ලී බඩු, කාබනික ජලය, රැලි සහිත ඇසුරුම් පෙට්ටි, පිඟන් නිෂ්පාදිත, විදුලි උපකරණ, වාහන වලට අදාළ උපකරණ, විදුලි පණිවිඩ භුවමාරු උපකරණ, සූර්‍ය බලශක්ති උත්පාදකයන්, චුම්බක උපකරණ, ස්වර්ණාභරණ, කොහුබත් පොහොර කැට, පාවහන් සහ ප්ලාස්ටික් නිෂ්පාදිත වර්ග අන්තර්ගත වේ.

1.25 සංඛ්‍යා සටහන
ආයෝජන ප්‍රවර්ධන කලාප - සේවා නියුක්තිය සහ අපනයන ඉපැයුම් 1992-1993

| කාර්මික ගණය | 1992 | | 1993(අ) | |
|---|---|---|---|---|
| | සේවා නියුක්තිය (දෙසැම්බර් අවසානයට සංඛ්‍යාව) | දළ අපනයන ඉපැයුම් (නැ.වි.ස.) රු.දශ ලක්ෂ | සේවා නියුක්තිය (දෙසැම්බර් අවසානයට සංඛ්‍යාව) | දළ අපනයන ඉපැයුම් (නැ.වි.ස.) රු.දශ ලක්ෂ |
| 1 ආහාර, පාන වර්ග සහ දුම්කොළ | 2,480 | 1,730 | 3,094 | 2,838 |
| 2. රෙදිපිළි, ඇඳුම් පැළඳුම් සහ සම් නිෂ්පාදිත | 63,103 | 30,488 | 69,952 | 56,890 |
| 3. දැව හා දැව නිෂ්පාදිත (ගෘහ භාණ්ඩ ඇතුළුව) | 58 | 18 | 628 | 145 |
| 4. කඩදාසි හා කඩදාසි නිෂ්පාදිත, මුද්‍රණ සහ ප්‍රකාශන | 150 | 111 | 276 | 155 |
| 5. රසායනික ද්‍රව්‍ය, ඛනිජ තෙල්, ගල් අඟුරු, රබර් සහ ප්ලාස්ටික් නිෂ්පාදිත | 7,291 | 2,436 | 10,349 | 4,114 |
| 6. ලෝහ නොවන ඛනිජ නිෂ්පාදිත (ඛනිජ තෙල් සහ ගල් අඟුරු හැර) | 6,966 | 3,315 | 7,270 | 3,410 |
| 7. සකස් කළ ලෝහ නිෂ්පාදිත, යන්ත්‍ර සූත්‍ර සහ ප්‍රවාහන උපකරණ | 1,498 | 994 | 609 | 297 |
| 8. අන් තැනක සඳහන් නොවූ නිෂ්පාදිත | 16,447 | 8,858 | 21,182 | 7,012 |
| 9. සේවා (ආ) | 6,227 | 1,180 | 8,805 | 1,879 |
| එකතුව | 104,220 | 49,130 | 122,165 | 76,740 |

මූලය : ශ්‍රී ලංකා ආයෝජන මණ්ඩලය

(අ) තාවකාලික
(ආ) 'එයාර් ලංකා' හැර

1993 වසරේදී ශ්‍රී ලංකා ආයෝජන මණ්ඩලය දේශීය ආදායම් පනත සහ බදු සම්බන්ධිත නීති (සාමාන්‍ය දිරි දීමනා යෝජනා ක්‍රමය) යටතේ ව්‍යවසායයන් 87 ක් අනුමත කරන ලදී. මෙම ව්‍යාපෘතීන්ගෙන් අපේක්ෂිත මුළු ආයෝජනය රුපියල් දශලක්ෂ 1,566 ක් වන අතර, එහි විදේශීය ආයෝජන දායකත්වය රුපියල් දශලක්ෂ 1,079 ක් සහ දේශීය ආයෝජන දායකත්වය රුපියල් දශලක්ෂ 487 ක් වේ. මෙම ව්‍යාපෘති වල අපේක්ෂිත සේවා නියුක්තිය පුද්ගලයින් 3,157 ක් වේ.

පසුගිය වසර හා සසඳන කල, 1992 දී ශ්‍රී ලංකා ආයෝජන මණ්ඩලයට අයත් ව්‍යවසායයන්හි දළ අපනයන ඉපැයුම්වල වටිනාකම රුපියල් දශලක්ෂ 49,130 (වි.ගැ.හි. දශලක්ෂ 796) සිට 1993 දී රුපියල් දශලක්ෂ 76,321 (වි.ගැ.හි. දශලක්ෂ 1,133) දක්වා ඉහළ නගින ලදී. මෙය රුපියල් දශලක්ෂ 27,191 ක හෝ සියයට 55 ක වැඩිවීමකි. වි.ගැ.හි. අගය අනුව මෙම වර්ධනය සියයට 42 කි. පසුගිය වර්ෂයේ පැවති මට්ටමට වඩා මෙම වර්ෂයේදී රෙදිපිළි, නිමි ඇඳුම් සහ සම් නිෂ්පාදනයන්ගේ දළ අපනයන වටිනාකම සියයට 86 කින් වැඩි විය. ශ්‍රී ලංකා ආයෝජන මණ්ඩලයේ ව්‍යවසායයන්ගේ මුළු අපනයන ඉපැයීම් වලින් සියයට 74 කට දායක වෙමින් මෙම අංශය නොකඩවා විදේශීය විනිමය ඉපැයීමේ ප්‍රධානියා වශයෙන් ක්‍රියාත්මක විය. විද්‍යුත් අමතර කොටස්, පුරවන ලද සෙල්ලම් බඩු, මත්ස්‍ය නිෂ්පාදිත, රසායනික ද්‍රව්‍ය, රබර් සහ ප්ලාස්ටික් නිෂ්පාදන සහ දුම්කොළ නිෂ්පාදිත යනාදිය ඇඟළුම් නොවන අපනයන අංශයේ ප්‍රධාන අපනයන ඉපැයීම් පෙන්වූ නිෂ්පාදනයන් වේ.

1993 වසර තුළදී ශ්‍රී ලංකා ආයෝජන මණ්ඩලය, සිංගප්පූරුව, මැලේසියාව, ජර්මනිය, එක්සත් රාජධානිය, කැනඩාව, ප්‍රංශය, ඕස්ට්‍රේලියාව සහ මැද පෙරදිග යන රටවල ආයෝජන ප්‍රවර්ධන කිරීමේ කාර්යයන්හි නිරත විය. 1993 ජූනි 29 දින සිට 1993 ජූලි 1 දින දක්වා කාලය තුළ ශ්‍රී ලංකා රජය සමඟ පැවති ආර්ථික විද්‍යාඥයන්ගේ වටමේස සාකච්ඡාව ඇතුළුව, තවත් දේශීය ආයෝජන සම්මන්ත්‍රණ 5 ක් ශ්‍රී ලංකාවේ දී පවත්වන ලදී.

## ඇඟළුම් ශාලා 200 වැඩපිළිවෙල

1993 දෙසැම්බර් මස අවසාන වනවිට, ඇඟළුම් කර්මාන්තශාලා 200 වැඩපිළිවල යටතේ රැකියා අවස්ථාවන් 70,000 ක් පමණ සපයමින් ආයතන 134 ක් නිෂ්පාදන කටයුතු වල නියැලී සිටි අතර, තවත් ආයතනයන් 27 ක් ව්‍යාපාර ආරම්භ කිරීමේ විවිධ අවස්ථාවල නිරත වී සිටියහ. මෙම වැඩපිළිවෙලට, පුද්ගලික අංශයෙන් දායක වූ ප්‍රාග්ධනයේ වටිනාකම රුපියල් බිලියන 4.8 ක් ලෙසට ඇස්තමේන්තු කර ඇත. 1993 වසරේදී ශ්‍රී ලංකා ආයෝජන මණ්ඩලය යටතේ වාර්තා කරන ලද මුළු රෙදිපිළි සහ ඇඟළුම් අපනයන වලින් සියයට 52 ක් නැතිනම් රුපියල් දශලක්ෂ 29,589 ක් මෙම ආයතන මගින් අපනයනය කර ඇත.

## නව කර්මාන්තවල ප්‍රාදේශීය ව්‍යාප්තිය

ප්‍රාදේශීය සංවර්ධන අරමුණෙන් සහ බොහෝ කර්මාන්ත කොළඹ දිස්ත්‍රික්කය තුළ ඒකරාශී වීමේ අහිතුවූ ප්‍රතිවිපාක ඉවත් කිරීමේ අරමුණෙන් 1990 ට පසු කාලයේ ග්‍රාමීය අංශයේ කාර්මික කටයුතු නගා සිටුවීමේ ප්‍රතිපත්තියක් ආරම්භ කරන ලදී. කර්මාන්ත, විද්‍යා සහ තාක්ෂණ අමාත්‍යාංශය අනුමත කරන ලද පුරෝගාමී සහ පවත්නා කර්මාන්ත පුළුල් කිරීම යටතේ කර්මාන්ත 348 ක් දිස්ත්‍රික්ක 21 ක් තුළ පිහිටුවා ඇති බව වාර්තා වී තිබේ. මෙම කර්මාන්ත වලින් සියයට 40 ක් කොළඹ දිස්ත්‍රික්කයෙන් පිටත පිහිටා තිබුණි.

1993 වසර අවසාන වනවිට ශ්‍රී ලංකා ආයෝජන මණ්ඩලයේ ව්‍යවසායයන් 305 ක් දිස්ත්‍රික්ක 14 ක් තුළ ක්‍රියාත්මක වෙමින් පැවැතුණි. කටුනායක සහ බියගම වෙළඳ කලාප වල ඇති ඉහළ පසුතල පහසුකම් හේතුවෙන් මෙම ව්‍යවසායයන්ගෙන් සියයට 82 ක් එනම් ව්‍යවසායයන් 251 ක් කොළඹ සහ ගම්පහ දිස්ත්‍රික්ක වල ඒකරාශී වී තිබුණි. අම්පාර, ත්‍රිකුණාමලය, මඩකලපුව, වවුනියාව, මොණරාගල, මාතලේ සහ හම්බන්තොට වැනි දුෂ්කර ප්‍රදේශවල ශ්‍රී ලංකා ආයෝජන මණ්ඩලයේ ව්‍යවසායයන් ස්ථානගත වී තිබීම ද කැපී පෙනෙන ලක්ෂණයක් විය.

ඇඟළුම් කම්හල් 200 වැඩපිළිවෙල ක්‍රියාත්මක වීමත් සමඟ, පෙහෙකම්හල් විශාල සංඛ්‍යාවක් රටේ බොහෝ දුෂ්කර ප්‍රදේශවල ආරම්භ විය. 1993 අවසාන වනවිට වාණිජ කටයුතු ආරම්භ කරන ලද ඇඟළුම් කම්හල් 134 ක් අතුරින් කර්මාන්තශාලා 118 ක් කොළඹ සහ ගම්පහ දිස්ත්‍රික්ක වලින් පිටත පිහිටුවා තිබුණි. මේ මගින් වාසි අත්පත් කරගත් දිස්ත්‍රික්ක අතර, අනුරාධපුර, රත්නපුර, කුරුණෑගල සහ කෑගල්ල යන දිස්ත්‍රික්කවල පිළිවෙලින් කර්මාන්තශාලා, 15, 13, 10 සහ 9 බැගින් පිහිටුවා තිබුණි.

1.26 සංඛ්‍යා සටහන
තව කර්මාන්තයන්හි ප්‍රාදේශීය ව්‍යාප්තිය

(සංඛ්‍යා වලින්)

| දිස්ත්‍රික්කය | කර්මාන්ත අමාත්‍යංශය යටතේ පවත්නා කර්මාන්තයන් (අ) දැනට පවතින කර්මාන්ත පුළුල් කිරීම් | කර්මාන්ත අමාත්‍යංශය යටතේ පවත්නා කර්මාන්තයන් (අ) පුරෝගාමී කර්මාන්ත | ශ්‍රී ලංකා ආයෝජන මණ්ඩලය යටතේ පවත්නා කර්මාන්ත (ආ) | ඇඟළුම් කම්හල් 200 වැඩපිළිවල යටතේ පවත්නා කර්මාන්ත (ආ) | එකතුව |
|---|---|---|---|---|---|
| 1 කොළඹ | 136 | 80 | 64 | 10 | 290 |
| 2. ගම්පහ | 72 | 3 | 187 | 6 | 268 |
| 3. අම්පාර | - | - | - | 2 | 2 |
| 4. ත්‍රිකුණාමලය | - | - | - | 2 | 2 |
| 5. මඩකලපුව | - | - | - | 3 | 3 |
| 6. අනුරාධපුරය | 1 | 2 | 1 | 15 | 19 |
| 7. වවුනියාව | - | - | - | 2 | 2 |
| 8. පොළොන්නරුව | - | - | 2 | 4 | 6 |
| 9. කුරුණෑගල | 7 | 1 | 5 | 10 | 23 |
| 10. පුත්තලම | 4 | 1 | 10 | 8 | 23 |
| 11. බදුල්ල | - | - | 2 | 9 | 11 |
| 12. මොණරාගල | - | - | - | 3 | 3 |
| 13. මහනුවර | 5 | 1 | 3 | 6 | 15 |
| 14. නුවරඑළිය | 5 | - | 3 | 4 | 12 |
| 15. මාතලේ | 1 | - | - | 3 | 4 |
| 16. හම්බන්තොට | - | - | - | 7 | 7 |
| 17. කළුතර | 11 | 8 | 5 | 8 | 32 |
| 18. ගාල්ල | 3 | 1 | 7 | 6 | 17 |
| 19. මාතර | 1 | 1 | 10 | 4 | 16 |
| 20. රත්නපුර | 2 | - | 4 | 13 | 19 |
| 21. කෑගල්ල | 2 | - | 2 | 9 | 13 |
| එකතුව | 250 | 98 | 305 | 134 | 787 |

(අ) 1993 ඔක්තෝබර් 25 දක්වා
(ආ) 1993 දෙසැම්බර් 31 දක්වා

මූලය : කර්මාන්ත, විද්‍යා හා තාක්ෂණ අමාත්‍යංශය
ශ්‍රී ලංකා ආයෝජන මණ්ඩලය